# දේශයට සරිලන දෙවිදහමක්

එස්. එල්. විජේසිංහ

දෙවන වතිකානු ජගත් සම්මන්ත්‍රණයට වසර සතළිසක් සපිරී ඇත. බයිබලීය ගණින් ගැනීම අනුව වසර සතළිසක් යනු පරම්පරාවක් ගෙවී නවත් පරම්පරාවක් ඇරඹීමකි. දෙවන වතිකානු ජගත් සම්මන්ත්‍රණයේ නිර්මාතෘවරුන්ගෙන් බහුතරය අද ජීවතුන් අතර නොමැත. සම්මන්ත්‍රණයේ පාප්වරුන් වූ XXIII ජුවාම් සහ VI පාවුලු ශාසන නායක උතුමාණන් ද, ඒ. බෙයා, බී. ඇල්ෆ්‍රින්ක්, ජී. ලෙර්කාරෝ, එල්. ජේ. සුනෙන්ස් වැනි කාර්දිනල් උතුමාණන් ද, කාර්ල් රානර් සහ ඊව් කොන්ගා වැනි දේවධර්ම විශාරදයන් ද සග සැපත් වී ඇත.[1] දෙවන වතිකානුවට සහභාගි වූ ශ්‍රී ලාංකේය රදගුරුවරුන් බහුතරය ද අද අප අතර නැත. වසර සතළිසක් යනු පරම්පරාවක වෙනසකි. එම කාලාන්තරය තුළ ධනාත්මක මෙන් ම ඍණාත්මක වෙනස්කම් ද සිදු වී ඇත. දෙවන වතිකානු සම්මන්ත්‍රණය මගින් ගොඩනගන ලද චින්තනය ඉදිරියට ගොස් ඇත. මෙදයින්, පුඑබ්ලා සමුළු ද, වසර සතළිසක් පුරා සාමයිකත්වය (Oecumenism) සහ අන්තර් ආගමික සංවාදය (Inter-Religious Dialogue) පිළිබඳ දේවධර්ම විද්‍යාත්මක විවෘත ප්‍රවණතා ද, බයිබලීය හරය පදනම් කරගෙන දේවධර්ම විද්‍යාව ප්‍රශ්න කිරීම සහ ගොඩනැගීම ද, මානව විමුක්තිය පතා සභාව පෙළ ගැසීම ද, දෙවන වතිකානු සම්මන්ත්‍රණයේ බලපෑමෙන් ලද ධනාත්මක ප්‍රතිඵල වේ.

එහෙත් මෙම වසර සතළිස තුළ පසුබෑම් රාශියක් ද වූ බව නොරහසකි. දෙවන වතිකානු සම්මන්ත්‍රණයේ චින්තනය ඉදිරියට ගෙන නොගොස් ආපස්සට යැවීම පිළිබඳ ව සභා නායකත්වය දෝෂාරෝපණයට ලක් වී ඇත. පශ්චාත් දෙවන වතිකානු යුගයේ ප්‍රතිගාමී ප්‍රතිපත්ති විවේචනයට ලක්කළ අය අතර දෙවන වතිකානු සම්මන්ත්‍රණයේ ප්‍රගතිශීලී චින්තනධරයෙකු වූ සුනෙන්ස් හිමි ද

© එස්. එල්. විජේසිංහ

කර්තෘ: පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි, ආර්. එම්. ඩබ්. රාජපක්ෂ, ඉන්ද්‍රා දසනායක, රොමේලා රකුල්
මානව ශාස්ත්‍ර පීඨ සංග්‍රහය, 5 කලාපය, 2008, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.